සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 11 ශ්‍රේණිය
## නැටුම් (දේශීය) - I

**නම/විභාග අංකය :-- .................................................................................. කාලය : පැය 01 යි.**

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විත ය.

**I** කොටසෙහි 1 - 30 දක්වා සියලුම ප්‍රශ්න සඳහා ද 30 -40 දක්වා ඔබ උගත් සම්ප්‍රදායට අදාල ප්‍රශ්න කොටස තෝරාගෙන පිළිතුරු සපයන්න.

**II** කොටසෙහි පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05 ක් සඳහා පිළිතුරු සපයන්න.

### I කොටස

1. දේශීය නර්තන සම්ප්‍රදායයන්හි බෙර වාදනයෙන් තොරව ............................. අභ්‍යාස කරයි.
   1. පා සරඹ, මණ්ඩි පද  2. පා සරඹ, අත් සරඹ
   3 ගොඩ සරඹ, ඉලංගම් සරඹ  4. මණ්ඩි පද, දොඹින පද

2. නර්තනයේ ප්‍රායෝගික කොටස් භාවිත වන ආකාරය ලියා දැක්වීම,
   1. රංග වින්‍යාසයි.  2. අංග රචනයයි.  3. රංග රචනයයි.  4. ප්‍රස්ථාරකරණයයි.


3. රංග කාර්යයට අදාළ රංග වස්ත්‍ර, වෙස්ගැන්වීම්, වේදිකා උපකරණ සැරසිලි ආදිය................ අයත් වේ.
   1. වාචික අභිනයට  2. ආහාර්ය අභිනයට  3. සාත්වික අභිනයට  4. ආංගික අභිනයට

4. බෙර වාදන පුහුණුවේදී ආධුනිකයකු මනා පුහුණුවක් ලැබිය යුත්තේ,
   1. ත්‍රිවිධ ලයට වාදනයයි.  2. බීජාක්ෂර හා ගර්භාක්ෂර වාදනයයි
   3. මඟුල් බෙර වාදනයයි.  4. අලංකාර පද වාදනයයි.

5. පුරාණයේ රාජ්‍ය පාලන කටයුතුවලදී සන්නිවේදන කාර්යය සඳහා ........................ වාදන කරනු ලැබී ය.
   1. අණබෙර, රණබෙර, වදබෙර, මළ බෙර  2. රණබෙර, පිංබෙර, මඟුල් බෙර, මළ බෙර
   3. පිං බෙර, යහන් බෙර, රණ බෙර, අණ බෙර  3. හේවිසි, පිං බෙර, යහන් බෙර, රණ බෙර

6. ''සොබමන් දෙවිවරු සඳෙනෙක් ........................'' යන කවිය
   1. සවරම් කවියකි.  2. පතුරු කවියකි.  3. චාමර කවියකි.  4. නමස්කාර කවියකි.

7. දිවිදොස් පුවත හා සේරමාන් පුවත පාදක වූ ශාන්තිකර්මයන් වනුයේ,
   1. කොහොඹා කංකාරිය, කඩවර කංකාරිය  2. රටයකුම, දෙවොල් මඩුව
   3. කොහොඹා කංකාරිය, දෙවොල් මඩුව  4. දෙවොල් මඩුව, පහන් මඩුව

8. A  B 

   A හා B ඡායාරූපයන්ගෙන් දැක්වෙන නර්තන වේදිනීන් වනුයේ,
   1. වජිරා චිත්‍රසේන මිය, චන්ද්‍රලේඛා පෙරේරා මිය
   2. මිරැන්ඩා හේමලතා මිය, රජිණි සෙල්වනායගම් මිය
   3. උපාලි පණීභාරත මිය, මිරැන්ඩා හේමලතා මිය
   4. වජිරා චිත්‍රසේන මිය, මිරැන්ඩා හේමලතා මිය

9. සකපෝරුව, ඉල්ලම්කූර යන උපකරණ සම්බන්ධවන ජීවන වෘත්තීන් වන්නේ,

1. තේ දළු කර්මාන්තය, කොහු කර්මාන්තය
2. මැටි කර්මාන්තය, පතල් කර්මාන්තය
3. පතල් කර්මාන්තය, ධීවර කර්මාන්තය
4. කොහු කර්මාන්තය, කෘෂි කර්මාන්තය

10. මෙම ගිම්හාන ග්‍රීෂ්ම වූ කාලේ ............ යන ගායනය,

1. ජන ගායනයකි.
2. නූර්ති ගීයකි.
3. ප්‍රශස්ති ගායනයකි.
4. ටීකා කවි ගායනයකි.

11. කරදිය, සත්පත්තිනි, සැළලිහිණිය මුද්‍රානාට්‍ය නිශ්පාදනය කළ ශිල්පීන් ලෙස සැලකෙන්නේ,

1. චිත්‍රසේන ඩයස්, එස්. පණීභාරත, නිමල් වෙල්ගමයන් ය
2. එස්. පණීභාරත, වජිරා චිත්‍රසේන, වසන්ත කුමාරයන් ය.
3. චිත්‍රසේන ඩයස්, එස්. පණීභාරත, ප්‍රේමකුමාර එපිටවෙලයන් ය.
4. එස්. පණීභාරත, ශේෂා පළිහක්කාර, චිත්‍රසේන ඩයස් ය.

12. දෙසුළු මහ තුන්තිතට අයත් තාල රූපයේ මාත්‍රා විභාග .................... ලෙස දැක්විය හැකි ය.

1. 2 + 2 + 4
2. 2 + 2 + 3
3. 2 + 3 + 4
4. 2 + 4 + 2

13. අනුපිළිවෙලින් පහත දැක්වෙන ඇඳුම් කට්ටල ........................ නර්තන සම්ප්‍රදායන්ට අයත් වේ.



1. සබරගමු, පහතරට, උඩරට
2. පහතරට, උඩරට, සබරගමු
3 උඩරට, පහතරට, සබරගමු
4. පහතරට, සබරගමු, උඩරට

14. ශාරීරික තත්ත්වයන් ඉක්මවා ගොස් මානසික, සමාජීයමය, අධ්‍යාත්මික වශයෙන් වූ සංවර්ධනය ....................... නම් වේ.

1. සුසමාහිත බව
2. ස්වස්ථතාව
3. චිත්තවේගික කුසලතා
4. චරිතායනය

15. 1930 වර්ෂයේ කේරළ කලා මණ්ඩලම් ආයතනය ස්ථාපිත කිරීමෙහි ලා දායක වූයේ,

1. වල්ලතෝල් නාරායනන් මෙනන් කලාකරුවා ය.
2. රවීන්ද්‍රනාත් තාගෝර් තුමන් ය.
3. උදය ශංකර් කලාකරුවා ය.
4. කොට්ඨාරක්කාරයේ තාම්පුරන් රජු ය.

16. වාචික අභිනයෙන් තොරව නර්තනය හා සංගීතය ප්‍රධාන මාධ්‍ය කරගනිමින් ඉදිරිපත් කරනු ලබන නාට්‍ය විශේෂය වන්නේ

1. ගීත නාට්‍ය
2. මුද්‍රා නාට්‍ය
3. ස්වාභාවික නාට්‍ය
4. ශෛලි ගත නාට්‍ය

17. නර්තනය යනු රිද්මය මූලික කොට ශරීරයේ අංග ප්‍රත්‍යාංග, උපාංග භාවිත කරමින්, චලනයන්ගෙන් මනෝභාව ප්‍රකාශිත කලාවයි, සංගීතය යනු ...............

1. රිද්මයට වාදන භාණ්ඩ ඇසුරෙන් නාද බිහිකිරීමයි.
2. වාද්‍ය භාණ්ඩ හා කටහඬ ආධාරයෙන් රිද්මයකට නාද ගොඩ නැඟීමයි.
3. ශබ්ද හා තාලානුකූලව තාල ඉදිරිපත් කිරීමයි.
4. රිද්මය මූලික කර වාදනය ඉදිරිපත් කිරීමයි.

18. ගීතයකට අනුව නර්තන නිර්මාණය කිරීමේදී .............

1. ගීතයේ සාහිත්‍යමය අර්ථය වැදගත් නොවේ.
2. ගීතයේ අර්ථයට උචිත චලන භාවිතය වැදගත් වේ.
3. වේගවත් සංගීත රිද්මයන් පැවැත්ම වැදගත් ය.
4. සාම්ප්‍රදායික නර්තනය පමණක් ඇසුරු කළ යුතු ය.

19. අටමඟලේ කවි හා මොහොලේ කවි ඇසුරු කර මෑත කාලීන ගැමි නැටුම් ක්ෂේත්‍රයට එක් වූයේ,
   1. කුළු නැටුමයි  2. වේවැල් නැටුමයි.  3. මෝල්ගස් නැටුමයි.  4. පන්නෙලීම නැටුමයි.

ප්‍රශ්න අංක 20 - 23 දක්වා පහත රූප සටහන් ඇසුරින් පිළිතුරු සපයන්න.



1 2 3 4 5 6

20. පංචතූර්ය භාණ්ඩ වර්ගීකරණය අනුව 6, 5, 3, 2 අනුපිළිවෙලින් වර්ග වනුයේ,
   1. ආතත, විතත, විතතාතත, සුෂිර  2. ආතත, සුෂිර, ඝණ, විතත
   3. ආතත, ඝණ, සුෂිර, විතත  4. සුෂිර, ඝණ, ආතත, විතතාතත

21. අතීතයේ සන්නිවේදන කාර්යය සඳහා භාවිත වාදන භාණ්ඩය දක්වෙනුයේ,
   1. 1 රූපයෙනි.  2. 4 රූපයෙනි.  3. 6 රූපයෙනි.  4. 2 රූපයෙනි.

22. මෙම වාද්‍ය භාණ්ඩ අතර ගායනයට වාදනයට මෙන්ම නර්තනයට භාවිත වාද්‍ය භාණ්ඩය
   1. පහතරට බෙරයයි.  2. දවුලයි  3. තම්මැට්ටමයි.  4. උඩැක්කියයි.

23. හේවිසි වාදනයේදී භාවිත විතත විතතාතත, සුෂිර භාණ්ඩ අනුපිළිවෙලින් දක්වෙන්නේ,
   1. 1, 2, 5 රූප මගිනි.  2. 1, 2, 4, රූප මගිනි.  3. 2, 1, 5 රූප මගිනි.  4. 5, 2, 1 රූප මගිනි

ප්‍රශ්න අංක 24 සිට 27 දක්වා ප්‍රශ්නවලට පහත වගුව ඇසුරෙන් පිළිතුරු සපයන්න.

| පේළිය | A තීරය | B තීරය | C තීරය | D තීරය |
|---|---|---|---|---|
| 1 පේළිය | සම්ප්‍රදාය | පැරකුම්බා සිරිත | හන්තාන | ප්‍රශස්ති |
| 2 පේළිය | ග්‍රහ පන්ති | පඬුවස් දෙව් රජු | ලන්තැනින් කියත්... | සීනිගම |
| 3 පේළිය | භාව ප්‍රකාශනය | කිරිටම් | සාත්වික අභිනය | ශ්‍රී නාමය |
| 4 පේළිය | නෙත්තිමාලය | සේරමාන් රජු | ටීකා සී පද | වෙස්මුහුණු |

24. සාර්ථකව අංග රචනය කිරීමෙන් තීව්‍ර වන්නේ
   1. A තීරයේ 3 සහ D තීරයේ 4 වේ.  2. D තීරයේ 4 සහ A තීරයේ 1 වේ.
   3. A තීරයේ 3 සහ A තීරයේ 1 වේ.  4. C තීරයේ 3 සහ A තීරයේ 3 වේ.

25. කොහොඹාකංකාරිය පුවතට අනුව ඌරා ගලක් බවට පත්වූයේ හා දොවොල්මඩු පුවතට අනුව හිසේරුදාවන් හට ගත්තේ,
   1. D තීරයේ 2 සහ B තීරයේ 2 වේ.  2. C තීරයේ 1 සහ B තීරයේ 2 වේ.
   3. C තීරයේ 1 සහ B තීරයේ 4 වේ.  4. D තීරයේ 2 සහ B තීරයේ 1 වේ.

26. B - 1 හා D - 3 මගින් දක්වෙන සාම්ප්‍රදායික ගායන විශේෂ වන්නේ.,
   1. A තීරයේ 2  2. D තීරයේ 1  3. C තීරයේ 4  4. C තීරයේ 2

27. දේශීය හා විදේශීය රංග සම්ප්‍රදායන් හී ශීර්ෂාභරණ අනුපිළිවෙලින් දක්වෙනුයේ,
   1. 4 පේළිය D තීරය සහ 3 පේළිය B තීරුවෙනි.  2. 3 පේළිය D තීරය සහ 4 පේළිය A තීරුවෙනි.
   3. 4 පේළිය D තීරය සහ 4 පේළිය A තීරුවෙනි.  4. 4 පේළිය A තීරය සහ 3 පේළිය B තීරුවෙනි.

28. යහපත් දිවිපැවැත්මක් උදෙසා නර්තන කලාව හා සම්බන්ධ සාරධර්මයක් නො වන්නේ.
   1. නර්තන තරගාවලින් සඳහා දායකත්වය දක්වීම.  2. ගුරු දෙපා නැමදීම හා ජ්‍යෙෂ්ඨ ශිල්පීන්ට ගරු කිරීම.
   3. දෙවි දේවතාවුන්ගෙන් ගුරුන්ගෙන් අවසර ගැනීම.  4. රංග භාණ්ඩ රංග වස්ත්‍රාභරණ සඳහා ගරු කිරීම.

29. ගමරාළ දිනක් ඇතෙකුගේ පිට නැගී දෙව්ලොවට ගිය බව සිය බිරිඳට පැවසීමෙන් ඈ විස්මයට පත්විය. මේ මගින් උපදින රසය කුමක් ද?
    1. අද්භුත    2. හාස්‍යය    3. ක්‍රෝධ    4. පුදුමය

30. මුරුගන් හෙවත් කතරගම දෙවියන් උදෙසා පූජාත්මක බාරහාර වෙනුවෙන් .................. නර්තනය කරයි.
    1. කරගම්    2. කාවාඩි    3. කෝලම්    4. සෙම්බු

## උඩරට සම්ප්‍රදාය

31. දෙ‍ෝං ජිංජිං තකට දොං තකු යන බෙර පදය .................. තාල රූපයට වාදනය කළ හැකි ය.
    1. $1'$ 2 3 / $1'$ 2 3    2. $\hat{1}$ 2 / $1'$ 2 3    3. $\hat{1}$ 2 3 / $1'$ 2 3 4    4. $\hat{1}$ 2 / $1'$ 2 3 4

32. කොහොඹා කංකාරියට අයත් ගායන සහිත නර්තන වශයෙන් ........................ දැක්විය හැකි ය.
    1. කුවේණි අස්න, පත්තිනි හා තොරන් යාගය    2. කුවේණි අස්න, කොහොඹා හැල්ල හා මඩුපුරය
    3. කුවේණි අස්න, මල් මඩුපුරය, කොහොඹා හැල්ල    4. කුවේණි අස්න, මුල් මාත්‍රය, යක් ඇනුම

33. උඩරට නර්තන සම්ප්‍රදායට අයත් පාරිභාෂිත වචන ලෙස .................. සැලකෙයි.
    1. කස්තිරම, සීරුමාරුව හා ගොඩ සරඹ    2. කස්තිරම, සීරුමාරුව හා යක්කම්
    3. යක්කම්, වන්නම්, හා ඉරට්ටිය    4. කලාසම, වන්නම් හා අඩව්ව

34. 'රුදග ජිත්තක තකට කුංදත් ....... මෙය,
    1. සිංහ රාජ වන්නමට අයත් කස්තිරමකි.    2. මුෂලඩි වන්නමට අයත් අඩව්වකි.
    3. සිංහරාජ වන්නමට අයත් අඩව්වකි.    4. මුෂලඩි වන්නමට අයත් කස්තිරමකි.

35. ශිඛාබන්ධනය, අවුල් හැරය, පායිම්පත අයත් වන්නේ,
    1. නයියඩි ඇඳුම් කට්ටලයට ය.    2. වෙස් ඇඳුම් කට්ටලයට ය.
    3. උඩැක්කි ඇඳුම් කට්ටලයට ය.    4. බෙර ඇඳුම් කට්ටලයට ය.

36. ගැටබෙරයට අයත් කොටස් ඇතුලත් වන්නේ,
    1. බෙරපුහුල, ඉල්ලම් මූදු හා කන්වරය    2. බෙර පුහුල, බෙර පටිය හා හැක්ම
    3. බෙර පුහුල, කැපුම් හම හා කයිපුඩි වළල්ල    4. බෙර පුහුල, හැක්ම හා ඉල්ලම් මූදු

37. ගොයම් නර්තනය, පොරපොල් පිටිය යන නර්තන ප්‍රාසංගික වේදිකාවට නිර්මාණය කරන ලද්දේ,
    1. ආචාර්ය එස්. පණීභාරතයන් ය.    2. ආචාර්ය චිත්‍රසේනයන් ය.
    3. ආචාර්ය මිරැන්ඩා හේමලතාවන් ය.    4. මහාචාර්ය මුදියන්සේ දිසානායකයන් ය.

38. දුටත් යනෙන විටත් දුවන...... යන කවි පාදය අයත් වනුයේ,
    1. සිංහරාජ වන්නමට ය.    2. මුෂලඩි වන්නමට ය.    3. හනුමා වන්නමට ය.    4. වෛරොඩි වන්නමට ය.

39. කොහොඹා කංකාරිය පුරාවෘත්තයේ ඇතුළත් චරිත දෙකකි.
    1. සේරමාන් රජු හා කුවේණිය    2. කුවේණිය හා මැණික් පාල බිසව
    3. විජය රජු හා සේරමාන් රජු    4. විජය රජු හා පඬුවස්දෙව් රජු

40. තත් තකට තක රොං.............. තක රොං තකරොං ගජිං ජිකුද.......... කුං දත් ජික රොං, හිස්තැනට අදාළ පද කොටස තෝරන්න.
    1. තත්කඩ කුද කුද, ගජිගත    2. ජිං කුද ගජිගත, ජිං තකට
    3. තත් කඩ තත් කඩ කුද, කිටි තකට    4. තත් තත් කඩතක, ගජිගත

## පහතරට සම්ප්‍රදාය

31. ගුංඳ, ගත්ගත ගත්ත ගුං ගුඳ බෙර පදය ......... තාල රූපයට වාදනය කළ හැකිය.
    1. 1´ 2 3 / 1´ 2 3    2. 1̂ 2 / 1´ 2 3    3. 1̂ 2 3 / 1´ 2 3 4    4. 1̂ 2 / 1´ 2 3 4

32. දොවොල් මඩු යාගයේ ගායනය සුවිශේෂ කොට යොදා ගන්නා නර්තනාංග වන්නේ,
    1. තොරණ් යාගය, යහන් දැක්ම, තෙල්මේ
    2. තොරණ් යාගය, පත්තිනි නැටීම, මල් යහන් නැටීම
    3. තොරණ් යාගය, වාහල නැටීම, යහන් දැක්ම
    4. තොරණ් යාගය, පන්දම් නැටීම, තෙල්මේ

33. පහතරට නර්තන සම්ප්‍රදායට අයත් පාරිභාෂික වචන ලෙස ................ සැලකෙයි.
    1. ඉරට්ටිය, සිංදු වන්නම්, ඉලංගම් සරඹ
    2. පා සරඹ, ඉරට්ටිය, ගොඩ සරඹ
    3. යක්කම්, ඉරට්ටිය, අඩව්ව
    4. කලාසම, ඉරට්ටිය, අඩව්ව

34. ''තත් ගඳ ගත දිත් දිත් තෙයි........'' මෙය,
    1. අනුරාගදණ්ඩ තාලය සිංදු වන්නමේ ඉරට්ටියයි.
    2. භාවාදි තාලය සිංදු වන්නමේ ඉරට්ටියයි.
    3. ගුද ගති ගත වට්ටමට අයත් සුරලයකි.
    3. ශුද්ධ තාලය සිංදු වන්නමේ ඉරට්ටියයි.

35. නළල් පටිය, තෙල් කච්චිය, පබළු හැට්ටය යන රංග වස්ත්‍රාභරණ අයත් වන්නේ,
    1. පත්තිනි ඇඳුම් කට්ටලයට ය.
    2. තෙල්මේ ඇඳුම් කට්ටලයට ය.
    3. දෙවොල් ඇඳුම් කට්ටලයට ය.
    4. ශුද්ධමාත්‍රා ඇඳුම් කට්ටලයට ය.

36. පහතරට බෙරයේ සම්මත දිග ප්‍රමාණය ........
    1. එක් වියත් තුන් අඟුලකි.    2. තුන් වියත් එක් අඟුලකි.    3. තුන් වියත් තුන් අඟුලකි.    4. පසලොස් අඟුලකි.

37. පහතරට නර්තන ශිල්පය නිර්මාණාත්මකව වේදිකාවට ගෙන එමේ ගෞරවය හිමි වන්නේ,
    1. කේ. ඇස්. ප්‍රනාන්දු මහතාට ය.
    2. ජී.වී. හීන්නිලමේ මහතාට ය.
    3. සවුරිස් සිල්වා මහතාට ය.
    4. කාලිංග ඔබේවංශ මහතාට ය.

38. සුරිඳුනි අසන් මකියන බස බැති පෙමිණ....... යන කවි පාදය ගායනය කරනුයේ,
    1. භාවාදි තාලය සිංදු වන්නමට ය.
    2. ශුද්ධ තාලය සිංදු වන්නමට ය.
    3. ලලිත රාග තාලය සිංදු වන්නමට ය.
    4. අනුරාග දණ්ඩ තාලය සිංදු වන්නමට ය.

39. දෙවොල් මඩු පුරාවෘත්තයේ ඇතුළත් චරිත දෙකකි.
    1. සේරමාන් රජු හා පඬුවස්දෙව් රජ
    2. මැණික්පාල බිසව සේරමාන් රජ
    3. කුවේණිය හා විජය රජු
    4. සේරමාන් රජු හා පත්තිනි දේවිය.

40. දොම් තත් දිමිගත....... ගත ගුහිතිග දිරිකිට.........
    1. තරිකිට, දොම් තක් ගුද    2. ගුහිති, ගහිති, දොම්ගතගුද    3. ගුගුදිත, දොම්ගත ගත    4. රෙගෙත තත්ත, ගුදගත්

## සබරගමු සම්ප්‍රදාය

31. කුදත් තක්කිට තකට ජිමිතකු ........ යන බෙර පදය ........ තාල රූපයට වාදනය කළ හැකි ය.
    1. 1´ 2 3 / 1´ 2 3    2. 1̂ 2 / 1´ 2 3    3. 1̂ 2 3 / 1´ 2 3 4    4. 1̂ 2 / 1´ 2 3 4

32. පහන් මඩු යාගයේ ගායනය සුවිශේෂ කොට යොදා ගන්නා නර්තනාංග වන්නේ,
    1. මල්මඩුපුරය, මුල්මාත්‍රය, යහන් දැක්ම
    2. මල්මඩුපුරය, තොරණ්යාගය, මල්යහන් නැටීම
    3. මල්මඩුපුරය, මුදුන්තාලය, දේවකෝල්පාඩුව
    4. මල්මඩුපුරය, දේව කෝල්පාඩුව, හත්පද පෙළපාලිය

33. සබරගමු නර්තන සම්ප්‍රදායට අයත් පාරිභාෂිත වචන ලෙස .......... සැලකේ.
    1. කලාසම, මණ්ඩිපද, දොඹින පද
    2. මණ්ඩිපාද, කස්තිරම්, කලාසම
    2. යක්කම්, වන්නම්, ඉරට්ටිය
    4. කලාසම, අඩව්ව, කස්තිරම

34. තාත් තත් ජිත් තකට තත් ජිත් ...... මෙය,
    1. අනිලා වන්නමට අයත් අඩව්වයි.
    2. කොවුලා වන්නමේ කලාසමයි.
    3. අනිලා වන්නමේ කලාසමයි.
    4. කොවුලා වන්නමේ අඩව්වයි.

35. නෙත්තිමාලය, තෝඩු, හස්ථකඩය අයත් වන්නේ,
    1. දෙවොල් ඇඳුම් කට්ටලයට ය.
    2. පබළු ඇඳුම් කට්ටලයට ය.
    3. බෙර ඇඳුම් කට්ටලයට ය.
    4. සන්නි ඇඳුම් කට්ටලයට ය.

36. දවුලේ සම්මත දිග ප්‍රමාණය ලෙස සැලකෙන්නේ,
    1. තුන්වියතකි.
    2. දෙවියත් තුන් අඟුලකි.
    3. පසලොස් අඟුලකි.
    4. තුන්වියත් තුන් අඟුලකි.

37. ප්‍රවීණ සබරගමු නර්තන ශිල්පියෙකු වූ ......... මහතා සබරගමු ශාන්ති කර්ම යක්තොවිල් විෂයෙහි ප්‍රවීණයෙකි.
    1. ජී. වී. හීන්නිලමේ
    2. එස්. පණිභාරත
    3. සවුරිස් සිල්වා
    4. මුදියන්සේ දිසානායක

38. රුව සමනා උගත් මනා ඉසි වඩනා රිටු නොමිනා....... යන කවි පාදය අයත් වුනයේ,
    1. මණ්ඩුක වන්නමට ය.
    2. කොවුලා වන්නමට ය.
    3. විරාඩි වන්නමට ය.
    4. ආනන්ද වන්නමට ය.

39. පහන් මඬු පුරා වෘත්තයේ ඇතුළත් චරිත දෙකකි.
    1. සේරමාන් රජු හා පඬුවස්දෙව් රජු
    2. මැණික්පාල බිසව හා සේරමාන් රජු
    3. කුවේණිය හා විජය රජු
    4. සේරමාන් රජ හා පත්තිනි දේවිය

40. ගත්තකු ජිත්තා ............... ජිත්තා ගත කුද .............. තත්කඩ ජිත්කඩ හිස්තැනට අදාල පද කොටස තෝරන්න.
    1. දිරිකිට තරිකිට, ජිත්කඩ
    2. දොංකඩ තරිකිට, ජිංතක ජිංතක
    3. දොංකඩ තරිකිට, දොංකුඳ ගතකුද
    4. දිරිකිට තරිකිට, ජිංත ජිමිත්තත්

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 11 ශ්‍රේණිය
## නැටුම් (දේශීය) - II

**නම/විභාග අංකය :-- ..................................................................................** **කාලය : පැය 02 යි.**

♦ පළමු වන ප්‍රශ්නය අනිවාර්ය වේ.

♦ පළමු වැනි ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් සඳහා පිළිතුරු සපයන්න.

01. (1) වත්ත කතත් කතත් තා .... යන රබන් පදය ....... තිතට වාදනය කළ හැකි ය.
 (2) සොකරි නාටකයේ රඟ මඩල වශයෙන් .......... යොදා ගැනේ.
 (3) ස්වභාව සෞන්දර්ය වර්ණනා, දෙවියන් විවිධ වස්තූන් සත්වයන් පිළිබඳ වර්ණනා ........ ගායනයට පදනම් වී ඇත.
 (4) උඩරට නර්තන සම්ප්‍රදායේ අස්නේ නර්තනය ගායනය ............ නර්තන අවස්ථාවකි.
 (5) දේශීය ශාන්තිකර්මයන්හි දෙවියන් වැඩම වනු වස් .......................... සැරසිල්ලක් වශයෙන් සකස් කෙරේ.
 (6) මහනුවර ඇසල පෙරහැරෙහි දළදා කරඬුව ඉදිරිපිට සිට .......... නර්තන කණ්ඩායම ගමන් කරයි.
 (7) නර්තන නිර්මාණයන් හි භාවිත ප්‍රකාශනාත්මක චලන ............... වශයෙන් ද හැඳින්වේ.
 (8) ග්‍රහ අපල දුරු කිරීමට ගැයෙන ග්‍රහ පන්ති කවි .............. ශාන්ති කර්මයේ භාවිත වේ.
 (9) පහත දැක්වෙන නාට්‍යමය පෙළපාළීන් අන්තර්ගත ශාන්තිකර්ම දක්වන්න.
  1. ගබඩාකොල්ලය ........................  2. අසුර යක්කම ........................
 (10) කථකළී නර්තනයේ ප්‍රධාන ගායකයා හා සහාය ගායකයා ............ නමින් හැඳින්වේ.
  1. ප්‍රධාන ගායකයා .........................  2. සහාය ගායකයා .........................

02. (1) මාත්‍රා 2 + 4 තාලරූපයට බෙර පදයක් හෝ දවුල් පදයක් ප්‍රස්ථාර කරන්න.
 (2) යුද්දෙටත් ඇවිත් ........ යන කවියේ පද දෙකක් මාත්‍රා තුනේ (3 + 3) තනි තිතට ප්‍රස්ථාර කරන්න.
 (3) මුෂලඩි වන්නමේ අඩව්ව, ශුද්ධ තාලයේ ඉරට්ටිය හෝ කොවුලා වන්නමේ අඩව්ව ප්‍රස්ථාර කරන්න.

03 පහත සඳහන් මාතෘකා අතුරෙන් තුනක් කෙටියෙන් විස්තර කරන්න.
 1. සතර අභිනය  2. ටීකා සීපද  3. ද්‍රවිඩ ගැමි නැටුම්  4. හේවිසි වාදනය
 5. අංග රචනය

04. ශාන්තිකර්ම වූ කලී සංස්කෘතිමය වටිනාකම් ප්‍රදර්ශිත සමාජමය නිර්මාණයකි.
 (1) කොහොඹා කංකාරිය පැවැත්වීමේ අරමුණු හතරක් දක්වන්න.
 (2) දෙවොල් මඩුව හා පහන් මඩුව අතර තුලනාත්මක සබඳතා, පුරාවෘත්තය, චාරිත්‍ර විධි, නර්තනාංග ඇසුරෙන් දක්වන්න.
 (3) තෝරාගත් එක් ප්‍රධාන ශාන්ති කර්මයක භාවිත සැරසිලි අලංකරණ, අමුද්‍රව්‍ය පිළිබඳ අගයන්න.

05. පහත දැක්වෙන රූපරාමු ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A



B



C



D



(1) A හා B රූපවල දක්නට ඇති මුද්‍රා නාට්‍ය දෙක නම් කර ඉන් එක් මුද්‍රා නාට්‍යයක නර්තන නිර්මාණය අගයන්න.

(2) C රූපයේ දැක්වෙන භාරතීය නර්තන සම්ප්‍රදාය නම්කර එහි ප්‍රභවය හා විකාශය කෙටියෙන් විස්තර කරන්න.

(3) D රූපයේ දැක්වෙන චරිත දෙක දක්වා ඉන් එක් චරිතයක නිරූපණ කාර්යෙහි ලා නර්තනය ගායනය වාදනය භාවිතය විස්තර කරන්න.

06. (1) දේශීය නර්තනය පිළිබඳව තොරතුරු වාර්තා කරනු ලැබූ විදේශිකයන් දෙදෙනකු නම් කරන්න.

(2) ඉන් එක් විදේශීය සංචාරයකුගේ වාර්තාවක් ඉදිරිපත් කරන්න.

(3) නර්තන කලා ඉතිහාසය පිළිබඳව මහාවංශයේ සඳහන් සාධක දෙකක් ඇසුරෙන් තොරතුරු දක්වන්න.

07. (1) තෝරාගත් එක් ප්‍රධාන නර්තන සම්ප්‍රදායක ඇඳුම් කට්ටලයක කොටස් හතරක් නම් කරන්න.

(2) සාම්ප්‍රදායික රංග වස්ත්‍රාභරණ ආකෘතියක් නිර්මාණයේදී සැලකිලිමත් විය යුතු කරුණු හතරක් ලියන්න.

(3) ඔබ විසින් තෝරාගත් රංග වස්ත්‍රාභරණයක් නිර්මාණය කිරීමේදී අනුගමනය කළ පියවර සැකෙවින් දක්වන්න.

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

Answer

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 11 ශ්‍රේණිය
## නැටුම් (දේශීය) - පිළිතුරු පත්‍රය

I පත්‍රය

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| (1). 1 | (2) 4 | (3) 2 | (4) 2 | (5) 1 | (6) 3 | (7) 3 | (8) 4 | (9) 2 | (10) 2 |
| (11) 3 | (12) 1 | (13)4 | (14) 2 | (15) 1 | (16)2 | (17)2 | (18) 2 | (19) 3 | (20) 2 |
| (21) 1 | (22) 4 | (23) 3 | (24) 4 | (25) 3 | (26)2 | (27)4 | (28) 1 | (29) 1 | (30) 2 |
| (31) 3 | (32) 2 | (33)1 | (34) 4 | (35) 2 | (36) 3 | (37)1 | (38) 2 | (39) 4 | (40) 3 |

II කොටස

01. 1. මාත්‍රා 3 තනි තිත, මැදුම් තනි තිත, 3 + 3
2. කමත  3. වන්නම  4. සහිත 5. මල් යහන
6. වෙස්  7. අභිචලන  8. බලි  (මුළු ලකුණු 12)
9. - (1) - කොහොඹ කංකාරිය  (2) - පහන් මඩුව
10 - (1) - පොන්නානි  (2) - ශිංකිටි, ශිංකිඩි

02. 1. විභාග තාල සංකේත සඳහා - ලකුණු 02
බෙර පදය, දවුල් පදය ප්‍රස්ථාර සඳහා - ලකුණු 02
2. විභාග තාල සංකේත සඳහා - ලකුණු 02
කවිපද දෙක ප්‍රස්ථාර සඳහා - ලකුණු 02
3. විභාග තාල සංකේත සඳහා - ලකුණු 02
අඩව්ව, ඉරට්ටිය - ලකුණු 02 - (මුළු ලකුණු 12)

03. එක් මාතෘකාවක් සඳහා ලකුණු 4 බැගින් 4 x 3 = 12 (නිවැරදි කරුණු හතරක්වත් තිබේ නම් සම්පූර්ණ ලකුණු පිරිනමන්න.)

04. 1.
- සශ්‍රීකත්වය සෞභාග්‍ය පතා
- රෝග නිවාරණය සඳහා
- නිසිකල වර්ෂාව පතා
- ස්වාභාවික විපත් දුරුකර ගැනීමට
- ගමට රටට සෙත්පතා
- අධ්‍යාපනික සංරක්ෂණ අරමුණු සඳහා

(කරුණු 04 ට ලකුණු 02)

2.
- පුරාවෘත්තය - සේරමාන් පුවත පාදකවන බව - (ලකුණු - 02)
- චාරිත්‍ර විධි - අක්යාල වෙන් කිරීම, කප් සිටුවීම, තොටපේ කිරීම, මඩු පේ කිරීම, මිල්ල පේ කිරීම.....ආදිය කරුණු දෙකකට - (ලකුණු - 02)
- නර්තනාංග - යහන් දැක්ම, තොරණ යාගය, තෙල්මේ දෙවොල්, හත් පද පෙළපාළිය, පන්දම් පද, මල් යහන් නැටීම ආදිය කරුණු දෙකකට - (ලකුණු - 02)

3.
- ශාන්තිකර්මය තෝරා ගැනීම.
- සැරසිලි අලංකරණ නම් කිරීම
- සම්මත මිමි ප්‍රමාණ මත, සකසන බව.
- පුරුෂ පක්ෂය පමණක් දායක වන බව
- ස්වාභාවික අමුද්‍රව්‍ය භාවිත බව.
- මල්කම්, ලියකම්, සැරසිලි භාවිත බව
- විවිධ වර්ණ භාවිත බව.

(ලකුණු 04) -
(මුළු ලකුණු - 12)

5. (1) A - කරදිය B - කුඹි කතාව (ලකුණු - 01)
නර්තන නිර්මාණ ලක්ෂණ ඇගයීම
භාවිත නර්තන ශෛලීන් දැක්වීම.
නර්තනයෙන් ඔපවත් වූ අවස්ථා දැක්වීම. (ලකුණු -03)
නර්තන වින්‍යාසයේ විශිෂ්ට ලක්ෂණ දැක්වීම

(2) C - කථකලි නර්තන සම්ප්‍රදාය - (ලකුණු - 01)

- කථකලී කේරළයේ ප්‍රභවය ලැබූ බව.
- ග්‍රාමය දේව පූජා මූලික වූ බව.
- චක්කියාර්වරු මූලික වූ බව.
- රාමාට්ටම් කෘෂ්ණාට්ටම් විකාශයේ ද වැදගත් බව.
- වල්ලතෝල් නාරායන් මෙනන් දායකත්වය (ලකුණු 03)

(3) • චරිත දෙක - සොකරි, ගුරුහාමි (ආඬි ගුරු) (ලකුණු 01)

- තෝරාගත් චරිතය හැඳින්වීම
- රංග වස්ත්‍ර විස්තර කිරීම.
- නර්තනයේ ගායනයේ විශේෂතා දැක්වීම
- බෙරපද දැක්වීම
- චරිත නිරූපණයේදී භාවිත නර්තන ලක්ෂණ ඇගයීම (ලකුණු 03)

(මුළු ලකුණු 12)

6. (1) ස්පිල් බර්ජන්, රොබට් නොක්ස්, ඉබන් බතුතා.... (ලකුණු 02)

(2) තෝරාගත් විදේශික සංචාරකයෙකුගේ වාර්තාවක් ඉදිරිපත් කිරීම.

- රොබට් නොක්ස් - ඒ ඒ විහාර දේවාල ........
- ස්පිල් බර්ජන් - මහනුවර පෙරහැරේ.....
- ඉබන් බතුතා - දෙවුන්දර උපුල්වන් දේවාලයේ...... (ලකුණු - 04)

(3) මහා වංශය ''දුටුගැමුණු මහරජතුමා 16000 නළඟනන් පිරිවරා......
''භාතික අභය රජු මහා ථූපයට ......'' ආදි වශයෙන්,
සාධක දැක්වීම - (ලකුණු 02)
සාධකය ඇසුරු කර තොරතුරු ඉදිරිපත් කිරීම (ලකුණු 04)
(මුළු ලකුණු 12)

7. (1) තෝරාගත් ඇඳුම් කට්ටලයේ කොටස් 4 නම් කිරීම. (ඇඳුම් කට්ටලය නම් කර තිබිය යුතු ය.)
(ලකුණු 04)

(2) • සාම්ප්‍රදායික රංග වස්ත්‍රාභරණ මැනවින් නිරීක්ෂණය කර ඒ පිළිබඳ අධ්‍යයනය කිරීම.

- නිර්මාණයේදී භාවිත මිමි ප්‍රමාණයන් හඳුනා ගැනීම.
- සාම්ප්‍රදායික හැඩතල මෝස්තර මල්කම් ලියකම් පිළිබඳ අධ්‍යයනය කිරීම.
- භාවිත අමු ද්‍රව්‍ය මැනවින් හඳුනා ගැනීම.
- නිර්මාණ ශිල්ප ක්‍රම අධ්‍යයනය කිරීම (ලකුණු 04)

(3) තෝරාගත් රංග වස්ත්‍රාභරණයේ දළ සැකසීම, ආකෘතිය මැනවින් සකසා ගැනීම, අමුද්‍රව්‍ය රැස් කිරීම, විධිමත් ශිල්පක්‍රම භාවිත කර නිමවා ගන්නා ආකාරය අමුද්‍රව්‍ය හසුරුවන ආකාරය විස්තර කිරීම.
(ලකුණු 04)
(මුළු ලකුණු 12)